ශීර්ෂය - 135 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

------------------------------------------------------------------------------------------------

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස- එක් එක් විසර්ජන ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

1 කොටස

----------

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

--------------------------------------------------------------------------------------------

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව |

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,094,117,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,262,862,413 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.411,424,598 ක් හා රු.419,829,989 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක් හා සියයට 40 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 135 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 955,731,893 | 1,086,555,107 | 906,653,919 | 724,208,483 | 49,077,974 | 362,346,624 |
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 931,530,000 | 120,300,000 | 579,915,422 | 52,084,589 | 351,614,578 | 68,215,411 |
| | | 1,887,261,893 | 1,206,855,107 | 1,486,569,341 | 776,293,072 | 400,692,552 | 430,562,035 |

2.2 ආදායම් ගිණුම

(අ) ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේතයක් සඳහා රු.927,824,851 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.771,317,447 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමින් සියයට 83 ක ප්‍රතිශතයක් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | අඩුවෙන් එකතු කිරීම | රැස් කළ ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් | 20.02.01.04 | 927,824,851 | 771,317,447 | 156,507,404 | 83 |

2.3 අත්තිකාරම් ගිණුම්

2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන රබර් සංවර්ධන දෙපාර්තමෙන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 135 | 13501 | 6,000,000 | 4,497,549 | 3,000,000 | 3,066,358 | 31,000,000 | 16,603,096 |
| 293 | 29301 | 16,000,000 | 13,843,546 | 10,500,000 | 13,142,665 | 52,000,000 | 31,328,580 |

2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.53,124,519 ක්වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 6000/0000/000/0015/0047 | 1,061,211 |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0148 | 52,063,308 |
| | | 53,124,519 |

2 කොටස

එක් එක් විසර්ජන ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

1. ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

1.1 විගණන විෂය පථය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි 24 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම්

ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 08 ක් සඳහා සළසා තිබුණු රු.6,660,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.10,606,155 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(ආ) ආදායම් ගිණුම

ආදායම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ගිණුමට අනුව රු.300,689,703 ක්වූ ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාල පරාසයකට අදාළ විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේදී රු.927,824,851 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර, රු.771,317,447 ක ආදායමක් රැස්කර තිබුණි. එයින් 2012 වර්ෂයට අදාළව රු.482,189,262 ක් හෙවත් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 52 ක් පමණක් රැස්කර තිබුණි.

(iii) 2011 දෙසැම්බර් 31 දින වන විට 2009,2010 හා 2011 වර්ෂ වෙනුවෙන් අයකරගත යුතුව පැවති කල්බදු කුලී ආදායම රු.376,070,542 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.231,888,243 ක් හෙවත් සියයට 62 ක් පමණක් රැස්කරගෙන තිබුණි.

(iv) අගලවත්ත වැවිලි සමාගමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.39,069,195 ක් වූ කුලී ආදායමක් රැස්කර ගැනීමට ඇස්තමේන්තු කර තිබුණද ඉන් එක් වාරිකයක් හෝ අයකරගෙන නොතිබුණි.

(v) 2012 දෙසැම්බර් 31 දින වන විට 2009, 2010 හා 2011 වර්ෂයන් සඳහා හිඟහිටි කල්බදු කුලී ආදායම් පිළිවෙලින් රු.6,974,343 ක්, රු.35,251,757 ක් සහ රු.44,716,257ක් වූ අතර, හිඟ බදුකුලී අයකර ගැනීමේ කටයුතු දුර්වල

තත්ත්වයක පැවතුණි. තවද, බදුකුලී ප්‍රමාදවීම් සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමේ වැඩපිළිවෙලක්ද අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(vi) 1995 වර්ෂයේදී රජය ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක් සමඟ අත්සන් කර තිබුණු සංශෝධිත බදු ගිවිසුම් අනුව, ඉන් සමාගම් 03 කට අයත් වතු 45 ක 1994 දෙසැම්බර් 31 දිනට තිබූ ශුද්ධ වත්කම් වල වටිනාකම රු.මිලියන 200 ට අඩුවීම හේතුවෙන් බදුකුලී අයකරගෙන නොතිබුණි. එසේවුවද 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව උඩුපුස්සැල්ලාව වැවිලි සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.මිලියන 454 කින්ද 2011 වර්ෂයේ රු.මිලියන 255 කින්ද වර්ධනය වී තිබුණද එම සමාගමෙන් බදුකුලී අයකර ගැනීමේ හැකියාව පිළිබඳව නැවත සළකා බලා නොතිබුණි. මේ අනුව රජයට අයකර ගත හැකිව තිබූ බදුකුලී ආදායම් අහිමිව තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

(i) විෂය අංක 13501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,022,655 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) එම හිඟහිටි එකතුව රු.99,212ක් වූ ණය ශේෂ 07ක් අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

## 1.4 යහපාලනය සහ ගිණුම්කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

1.5 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- | --- |
| | | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 103(1)(ඊ) | 4,602,000 | කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනට අයත් වාහනයක් 2011 නොවැම්බර් 18 දින අනතුරට ලක්වී තිබුණු අතර, පරීක්ෂණ වාර්තාව අනුව 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම අලාභය අදාළ පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 103(1) | 105,840 | මෝටර් රථයක් 2011 අගෝස්තු 29 දින හදිසි අනතුරකට ලක්වීම හේතුවෙන් සිදුවූ අලාභය 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 104(2)(3)(4) | 232,500 | 2012 ජූලි 06 දින තොග නැතිවීම් සම්බන්ධයෙන් අලාභහානි වාර්තා කිරීමද ප්‍රාරම්භක සහ පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමද සිදුකර නොතිබුණි. |

1.6 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2012 වර්ෂයේදී මෝටර් වාහන 04 ක් හදිසි අනතුරුවලට ලක්වීමෙන් රු.1,656,215 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) ගබඩාවේ බඩු නැතිවීම් නිසා රු.232,500 ක අලාභයක් සිදු වී තිබුණි.

1.7 කළමනාකරණ දුර්වලතා

---------------------------

1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා රජයට අයත් ව්‍යාපාර ඒකක රාජ්‍ය සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ සහ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් පිහිටුවා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතු 571 ක් අවුරුදු 53 ක කාලයක් සඳහා 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා රජයට අයත් ව්‍යාපාර ඒකක රාජ්‍ය සමාගම් බවට පත්කිරීමේ පනත මඟින් එම සමාගම්වලට කල්බදු පදනම මත පවරා දෙන ලදී. අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වතු සමාගම් 15 කට අදාළව පවරා දෙන ලද වතු සංඛ්‍යාව පවරාදීමට අදාළ ගැසට් නිවේදනයේ සඳහන් වතු සංඛ්‍යාව අතර වතු 36 ක වෙනසක් පැවතුණි.

1.8 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 14 | 04 |
| (ii) | තෘතීයික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 88 | 63 | 25 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 43 | 42 | 01 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්) | 03 | 03 | - |
| | එකතුව | 155 | 124 | 31 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 31 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

2. ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

-------------------------------------------------------

2.1 විගණන විෂය පථය

------------------------

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි 24 දින රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා

සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2.3 විගණන නිරීක්ෂණ

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

------------------

වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.1,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------

(i) විෂය අංක 29301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාර එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,022,774 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අතරින් රු.103,558 ක ණය ශේෂ 2013 වසරේදී නිරවුල්කර තිබුණු අතර ඉතිරි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2012 වර්ෂය අවසානයට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය මුදල් රෙගුලාසි 427 පටහැනිව සසඳා නොතිබුණ අතර රු.2,533,476 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත් 2012-2016 කාල පරිච්ඡේදයට අදාළ සංයුක්ත සැලැස්ම 2012 නොවැම්බර් 20 දින පිළියෙල කර තිබුණි.

2.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

ඉහත 2.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 නොවැම්බර් 05 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

2.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 ජනවාරි 24 දින පිළියෙල කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.73,098,463 ක් පැවතුණි.

2.6 කාර්යසාධනය

2012 ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූල නොවීම

පහත සඳහන් අවස්ථාවලදී පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්මට අනුකූල වී නොතිබුණි.

(i) 2012 වර්ෂයේදී හෙක්ටයාර් 1,800 ක් නැවත රබර් වගා කිරීමට ඉලක්ක කර තිබුණද වර්ෂය අවසානයේදී හෙක්ටයාර් 1,113 ක් හෙවත් සියයට 62 ක් පමණක් වගා කර තිබුණි.

(ii) හෙක්ටයාර් 3,000 ක අලුත් වගාවක් සිදු කිරීම සමාලෝචිත වර්ෂයේ ඉලක්කය වුවද හෙක්ටයාර් 1270 ක් හෙවත් ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 42 ක් පමණක් අළුත් වගාවන් සිදුකර තිබුණි.

(iii) ක්‍රියාකාරී සැලැස්ම අනුව හෙක්ටයාර් 1,025 රබර් නැවත වගාව කළ යුතුව තිබුණද, හෙක්ටයාර් 181 ක් හෙවත් ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 18 ක පමණක් රබර් නැවත වගා කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී හෙක්ටයාර් 3,000 ක කුඩා රබර් වතු හිමියන්ගේ රබර් ඉඩම් සඳහා වැසි ආවරණ යෙදීමට ඉලක්ක කර තිබුණද, හෙක්ටයාර් 727 ක් හෙවත් සියයට 24 ක පමණක් වැසි ආවරණ යොදා තිබුණි.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු
-----------------------------------

ගැළපුම් කළයුතු ශේෂ
-----------------------

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැළපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | විස්තරය | මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි වර්ෂ 3 ට අඩු | එකතුව |
|---|---|---|---|---|
| | ---------- | ---------------------- | ---------------- | --------- |
| | | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 19,679 | 3,600 | 23,279 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 447,460 | 45,513 | 492,973 |

නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතුව රු 492,973 ක් වටිනා චෙක්පත් 147 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
--------------------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර ගනුදෙනු වූ අතර, එවැනි අවස්ථාවක් පහත සඳහන් වේ.

2010 පෙබරවාරි 24 දිනැති අංක 2010/04 දරන රබර් සංවර්ධන දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛය අනුව බද්ධ රබර් පැළයක් සඳහා ගෙවිය හැකි උපරිම මිල රු. 60 ක් වුවද 2012 වර්ෂයේදී බද්ධ රබර් පැළයක් මිලදී ගැනීම සඳහා රු.85 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව 2012 වර්ෂය තුළ බද්ධ රබර් පැළ මිලට ගැනීමේදී රු.653,250 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛය සංශෝධනය කර නොතිබුණු අතර, වෙල්ලස්ස තවානෙන් සහ පෞද්ගලික තවාන්වලින් පැළයක් රු.85 ක මුදලකට ලබා ගැනීමෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදෙස් අනුව කටයුතු කර නැති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ 2013 නොවැම්බර් 02 දිනැති පිළිතුරු ලිපියේ දක්වා තිබුණි.

2.9 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

අනුමත සේවක සංඛ්‍යා සහ තථ්‍ය සේවක සංඛ්‍යා

------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 20 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 337 | 256 | 81 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 68 | 54 | 14 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 21 | 21 | - |
| | එකතුව | 456 | 354 | 102 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 102 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.